සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

**10 ශ්‍රේණිය** | **වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024)** | **11 S I,II**

නම: ..............................................

**බුද්ධ ධර්මය**

**කාලය පැය තුනයි**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුල (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. බෝසත්වරයෙකු තමාගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම හඳුන්වනු ලබන්නේ ,
1. පංච උපාදානය ලෙස ය. 2. පංච මහා විලෝකනය ලෙස ය.
3. පංච උපාදානස්කන්ධය ලෙස ය. 4. පංචගති ලෙස ය.

02. තරුණ සිදුහත් කුමාරයට සැබෑ ජීවිතයේ යථාර්ථය අවබෝධ වූයේ ,
1. නිබ්බුත පද ඇසීමෙනි. 2. මාර දූවරුන්ගේ රංගනය දැකීමෙනි.
3. සතර පෙර නිමිති දැකීමෙනි. 4. නළඟන්ගේ විප්‍රකාර දැකීමෙනි.

03. යසෝදරා දේවියට පුතකු ලද බව පණිවුඩකරුවකු මගින් අසන්නට ලැබුණු විට සිදුහත් බෝසතුන්ගේ මුවින් " රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං " යනුවෙන් ප්‍රකාශ වූයේ ,
1. තම දේවියට පුතකු උපන් බව ඇසීම සතුට ගෙන දෙන්නක් බැවිනි.
2. රාහුල කුමාරයාට අනාගතයේ බන්ධන ඇතිවන බැවිනි.
3. උපන් කුමාරයාට රාහුල යන නම තැබිය යුතු බැවිනි.
4. ගිහිගෙයින් නික්ම පැවිදිවීමට බාධාවක් බැවිනි.

04. "රහසත් පව් නොකට - කෙලෙසරයනුත් දුරු කොට " ආදි මැයෙන් බුදුරජාණන් වහන්සේගේ " අරහං " බුදුගුණය වර්ණනා කරමින් සැකසුණු මෙම කවිය ඇතුළත් වන ග්‍රන්ථය වන්නේ ,
1. බුදුගුණාලංකාරය යි. 2. කාව්‍යශේඛරය යි. 3. බුත්සරණ යි. 4. ගුත්තිල කාව්‍ය යි.

05. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ධර්මය තමා විසින් ම පිළිපැද ඇස් පනාපිට මෙලොවදීම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ,
1. ආකාලික නම් වේ. 2. ස්වාක්ඛාත නම් වේ. 3. සන්දිට්ඨික නම් වේ. 4. ඒහිපස්සික නම් වේ.

06. සූවිසි ගුණ අතර මහා සංඝරත්නයේ ගුණයන් ද වී. අෂ්ටාර්ය පුද්ගල මහා සංඝරත්නයේ ගුණ ගණන ,
1. 6 කි. 2. 8 කි. 3. 7 කි. 4. 9 කි.

07. නිවන් මඟ ආවාරණය කරන පංචනීවරණ ධර්ම අතුරෙන් "ථීනමිද්ධ" උපමා කොට ඇත්තේ ,
1. පාසි සහිත ජලයකට ය. 2. කැළඹී ගිය ජලයකට ය.
3. බොර වී ගිය ජලයකට ය. 4. රත් වී උතුරන බුබුළු නගන ජලයකට ය.

08. භාවනාවට යොමුවන පුද්ගලයා විසින් "ලද දෙයින් සතුටු වීමේ" ගුණය ද පවත්වා ගත යුතුය. එය ධර්මයේ හැඳින්වෙන්නේ ,
1. ඉන්ද්‍රිය සංවරය ලෙස ය. 2. සන්තුට්ඨිතා ලෙස ය.
3. සති සම්පජඤ්ඤ ලෙස ය. 4. කායානුපස්සනා ලෙස ය.

09. සිදුහත් බෝසතාණන් වහන්සේ "කිංකුසල ගවේසී" ව සිටි කාලයේ සප්ත සමාපත්තිලාභී තවුසෙකු වූයේ ,
1. සර්වමිත්‍ර ය. 2. කොණ්ඩඤ්ඤ තවුසා ය. 3. භාර්ගව තවුසා ය. 4. ආලාරකාලාම තවුසා ය.

10. බුදුරජාණන් වහන්සේ ආර්ය මාර්ගය අනුගමනය කළ හෙයින් ද නිර්වාණයට සැපත් වූ හෙයින් ද යහපත් වචන ඇති හෙයින් ද,
1. සුගත නම් වේ. 2. අරහං නම් වේ. 3. භගවා නම් වේ. 4. ලෝකවිදූ නම් වේ.

11. සතර මහා භූත සඳහන් නිවැරදි වරණය වනුයේ ,
1. ආපෝ , තේජෝ , ඇස , කන ය. 2. දිව , ශරීරය , රූප , වාතය ය.
3. පඨවි , ආපෝ , තේජෝ , වායෝ ය. 4. චක්ඛු , සෝත , ඝාණ , ජිව්හා ය.

12. අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ග්‍රන්ථ අතරට අයත් නොවන ග්‍රන්ථය ,
1. සාරාර්ථ සංග්‍රහය යි. 2. බුදුගුණාලංකාරය යි. 3. මුණිගුණාලංකාරය යි. 4. සතර බණවර සන්නය ය.

13. බුදුරජාණන් වහන්සේ ජීවක අඹ උයනේ දී දේශනා කළ ධර්මය වන්නේ ,
1. සාමඤ්ඤඵල සූත්‍රය යි. 2. ධම්මචක්ක පවත්තන සූත්‍රය යි.
2. තේවිජ්ජ සූත්‍රය යි. 4. වේදනා පරිග්ගහ සූත්‍රය යි.

14. බුදුරජාණන් වහන්සේ සත්සතිය ගත කිරීමේ දී මුචලින්ද විල අසල ගත කළේ ,
1. පළමු සතියේදී ය. 2. තුන්වන සතියේදී ය. 3. සත්වන සතියේදී ය. 4. හයවන සතියේදී ය.

15. බොරුකීම , කේලාම්කීම , හිස්වචන කීම , රළු වචන කීම යන අකුසල් සතරින් වැළකී සිටීම ආර්ය මාර්ගයෙහි අන්තර්ගත වන්නේ කුමන මාර්ගාංගයට ද?
1. සම්මා කම්මන්ත. 2. සම්මා සංකප්ප. 3. සම්මා වාචා. 4. සම්මා ආජීව.

16. අවිධිමත් ලෙස එමෙන්ම ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු ගැන බෞද්ධ සාහිත්‍යයෙහි දැක්වේ. එයින් අනුන්ගේ අත් උදව් නැතිව නැගිටින්නට බැරි තරමට අධිකව ආහාර ගන්නා තැනැත්තා ,
1. අලංසාටක ය. 2. ආහාර හත්ථක ය. 3. තත්ථාවට්ටක ය. 4. භුත්තවමිතක ය.

17. බුදුරජාණන් වහන්සේ ගිරිමානන්ද හිමියන්ට රෝග වැළඳීමට හේතුවන කරුණු අටක් දේශනා කළහ. එම කරුණු අතරට අයත් නොවන කරුණ කුමක් ද?
1. ලේ ධාතුව කිපීම. 2. පිත් ධාතුව කිපීම.
3. කර්ම විපාක පදනම් වීම. 4. ඍතුවිපර්යාස හේතුවීම.

18. ජීවිත පුරුද්දක් ලෙස සිදුකරන ලද කුසලා කුසල කර්ම හා කලින් කරන ලදුව නිරන්තරයෙන් සිහිකරන ලද කුසලා කුසල කර්ම හඳුන්වනු ලබන්නේ ,
1. ආචිණ්ණ කර්ම නමිනි. 2. ගරුක කර්ම නමිනි.
3. ආසන්න කර්ම නමිනි. 4. කටත්තා කර්ම නමිනි.

19. දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප ශෝභාවක් ලැබීම හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාවක් උදාකර ගත හැක. මෙය,
1. ප්‍රයෝග සම්පත්තිය යි. 2. කාල සම්පත්තිය යි. 3. ගති සම්පත්තිය යි. 4. උපධි සම්පත්තිය යි.

20. "මම සම්බුද්ධ වෙමි.ශ්‍රේෂ්ඨතම ශල්‍ය වෛද්‍යවරයා ද වෙමි." යනුවෙන් බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ , උන්වහන්සේ ,
1. කායික රෝග වලට ප්‍රතිකාර කළ බවයි. 2. ශල්‍ය කර්ම සිදු කර බවයි.
3. මානසික රෝග නිවාරණයට මගපෙන් වූ බවයි. 4. උපස්ථායකයකු ලෙස කටයුතු කළ බවයි.

21. පරලොවක් නැත යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව ,
1. කාම තණ්හාව යි. 2. විභව තණ්හාව යි. 3. භව තණ්හාව යි. 4. රස තණ්හාව යි.

22. බහු ජාතික සහ බහු ආගමික සමාජයක් තුළ අන්‍ය ආගම්වලට ද ගරු කරමින් ස්වකීය අනන්‍යතාව තහවුරු වන පරිදි ජීවත් වීම ,
1. සහජීවනය නම් වේ. 2. සමානාත්මතාව නම් වේ.
3. සමජීවිකතාව නම් වේ. 4. ජාත්‍යාලය නම් වේ.

23. කරුණු නොදැන පදනමකින් තොරව ඇති කරගත් ශ්‍රද්ධාව ධර්මයෙහි හඳුන්වනු ලබන්නේ ,
1. ආකාරවති සද්ධා නමිනි. 2. අචල සද්ධා නමිනි.
3. අමූලිකා සද්ධා නමිනි. 4. අවෙච්චප්පසාද සද්ධා නමිනි.

24. යම්සේ ගසක මුල ශක්තිමත් ව නොගැල වී පවතින්නේ ද ඒ තාක් කල් එම ගස නැවත ලියාලන්නා සේ පුද්ගලයා ද නැවත නැවත දුකට පත්වන්නේ ,
1. ථිනමිද්ධ හේතු කොට ගෙන ය. 2. මානය හේතු කොට ගෙන ය.
3. වෛරය හේතු කොට ගෙන ය. 4. තණ්හාව හේතු කොට ගෙන යි

25. බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේ දෙවියෙක් , ගාන්ධර්වයෙක් , යක්ෂයෙක් , මනුෂ්‍යයෙක් නොවන බවත් " බුද්ධ " නම් වන බවත් දේශනා කරනු ලැබුවේ,
1. හුහුංක බමුණාට ය. 2. ද්‍රෝණ බමුණාට ය. 3. සොත්ථිය බමුණාට ය. 4. සහම්පති බමුණාට ය.

26. " ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් ද ඔබ වහන්සේ රුචි කරන්නේ " යන ප්‍රකාශය කළේ ,
1. සංජය පිරි වැජියා කෝලිත පිරිවැජියාට ය. 2. රාධ බමුණා ආනන්ද හිමියන්ට ය.
3. උපතිස්ස පිරිවැජියා අස්සජි හිමියන්ට ය. 4. උපක ආජීවකයා සැරියුත් හිමියෝට ය.

27. සතර බ්‍රහ්ම විහරණ හෙවත් සිවු බඹ විහරණවලට අයත් නොවන්නේ ,
1. සීලය. 2. කරුණාව. 3. මුදිතා. 4. උපේක්ඛා.

28. පළමු ධර්ම සංගායනාවේ දී මූලිකත්වය ගෙන ක්‍රියා කළ මහරහතන් වහන්සේ සහ රාජ්‍ය පාලකයා වන්නේ ,
1. සබ්බකාමී මහරහතන් වහන්සේ සහ අශෝක රජතුමාය.
2. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ සහ ධර්මාශෝක රජතුමාය.
3. යස මහරහතන් වහන්සේ සහ බිම්බිසාර රජතුමාය.
4. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සහ අජාසත් රජතුමාය.

29. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි සැමියා විසින් බිරියට ඉටුකළ යුතුකම් අතරට අයත් නොවන්නේ ,
1. අවමන් කිරීම. 2. ගරු කිරීම.
3. ඇඳුම් පැළඳුම් සපයා දීම. 4. ගෙදර වගකීම් පැවරීම.

30. දඹදෙණිය රාජ්‍ය සමයේ දී දෙවන පැරකුම්බා මහ රජතුමා විසින්, භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය කරන ලද සිංහලයේ විශිෂ්ටතම මහ කාව්‍ය කුමක් ද?
1. පූජාවලිය යි. 2. කව්සිළුමිණ යි. 3. ගුත්තිල කාව්‍ය යි. 4. සියබස්ලකර යි.

31. පොළොන්නරු යුගයේ දී විශාලතම චිත්‍රාවලිය දක්නට ලැබෙන ස්ථානය ලෙස සැලකෙන්නේ ,
1. ථූපාරාම විහාරය යි. 2. ගල් විහාරය යි. 3. තිවංක පිළිමගෙය යි. 4. දිඹුලාගල විහාරය යි.

32. ශ්‍රී ලාංකීය කලාකරුවාගේ අද්විතීය කලා කුසලතාවය මනාවට හුවා දක්වමින් ධර්ම සන්නිවේදනය මැනවින් ප්‍රකට කලා නිර්මාණය ලෙස සැලකෙන්නේ ,
1. කොරවක්ගල යි. 2. සඳකඩ පහණ යි. 3. බෝධිඝරය යි. 4. චෛතියඝරය යි.

33. සූත්‍ර , විනය , අභිධර්ම යන ත්‍රිපිටකයට විභාෂා නම් සර්වාස්තිවාද අටුවා ග්‍රන්ථ සම්පාදනය කරන ලද්දේ ,
1. කණිෂ්ක ධර්ම සංගයනාවේදී ය. 2. අලුවිහාර සංගයනාවේදී ය.
3. තෙවන ධර්ම සංගයනාවේදී ය. 4. බුරුම ධර්ම සංගයනාවේදී ය.

34. " මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කාලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය" මෙම පාඨයට අනුව කටයුතු කළ රාජ්‍ය පාලකයා ,
1. වළගම්බා මහරජතුමා ය. 2. මහා පරාක්‍රමබාහු රජතුමා ය.
3. ධාතුසේන මහරජතුමා ය. 4. දුටුගැමුණු මහරජතුමා ය.

35. බුදුරජාණන් වහන්සේ පස්වන වස් කාලය ගත කළේ කුමන ස්ථානයේ ද ?
1. භේෂකලා පර්වතයෙහි ය. 2. චාලිය පර්වතයෙහි ය.
2. විශාල මහනුවර කූඨාගාර ලෙනෙහි ය. 4. මකුල පර්වතයෙහි යි.

36. " ආහාරෙ මත්තඤ්ඤුතා " හෙවත් පමණ දැන ආහාර අනුභවය පිළිබඳ බුදුරජාණන් වහන්සේගෙන් උපදෙස් ලබාගත් රාජ්‍ය පාලකයා ,
1. උදේනි රජතුමා ය. 2. බිම්බිසාර රජතුමා ය. 3. අජාසත් රජතුමා ය. 4 කොසොල් රජතුමා ය.

37. සිල් රැකීමෙන් ලැබෙන ආනිශංස ගණයට ඇතුළත් නොවන කරුණක් වන්නේ ,
1. කීර්තිය පැතිරීම යි. 2. සිහි මුළා වී කලුරිය කිරීමයි.
3. ඕනෑම පිරිසක් වෙත නිර්භයව යා හැකිවීම. 4. මරණින් මතු උපත ලැබීමයි.

38. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට බෙදා දැක්වීමේ දී සීලය යටතට අයත් මාර්ග අංග ඇතුළත් වරණය දැක්වෙන්නේ ,
1. සම්මා දිට්ඨි , සම්මා සංකප්ප , සම්මා කම්මන්ත. 2. සම්මා වාචා , සම්මා වායාම , සම්මා සමාධි.
3. සම්මා වාචා , සම්මා කම්මන්ත, සම්මා ආජීව. 4. සම්මා ආජීව , සම්මා සති , සම්මා දිට්ඨි.

39. ස්තූපය සඳහා ඉදි වූ වෘත්තාකාර පියස්සක් සහිත ගෘහය ලෙස සලකනු ලබන්නේ ,
1. පටිමාඝරය යි. 2. බෝධිඝරය යි. 3. වාහල්කඩ යි. 4. චෛතියඝරය යි.

40. මිහිඳු මහරහතන් වහන්සේගේ උපදෙස් පරිදි බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කොට ඉදිකරනු ලැබූ ස්තූපය ,
1 ලංකාරාමය යි. 2. ථූපාරාමය යි. 3. අම්බස්ථල සෑයයි. 4. කණ්ඨක චෛත්‍යය යි.


(4) WWW.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 11 S II

නම: ........................................ | **බුද්ධ ධර්මය** | කාලය පැය දෙකයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න .
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක්ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමිවේ.

01. I. සිදුහත් කුමාරයට සුදෙවුන් මහරජතුමා විසින් ඉදිකර දුන් මාළිගා තුන ලියන්න.
    II. සංඝරත්නයේ ගුණ දැක්වෙන පාඨයේ " සුපටිපන්න " යන්නෙහි අදහස ලියන්න.
    III. " චිත්තං සමේතීති සමථෝ " යන පාඨයේ අර්ථය ලියන්න.
    IV. අකුසල මූල තුන නම් කරන්න.
    V. " යෙ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ " මෙම ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
    VI. ත්‍රි ලක්ෂණය නම් කරන්න.
    VII. අනුරාධපුර යුගයේ දක්නට ලැබෙන සඳකඩ පහණෙහි ඇති සත්ත්ව රූප හතර මොනවා ද?
    VIII. සද්ධර්ම රත්නාවලිය නැමති ග්‍රන්ථය රචනා කළ යුගය සහ කතුවරයා නම් කරන්න.
    IX. අනුරාධපුරය යුගයේ රචනා වූ සාහිත්‍ය කෘතිවලින් දැනට ඉතිරි වී ඇති ග්‍රන්ථ දෙකක් සඳහන් කරන්න.
    X. එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම ( PALI TEXT SOCIETY ) පිහිටුවා ගනු ලැබූ පඬිවරයා නම් කරන්න.

02. I. බුදු දහමේ උගන්වන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.
    II. ඉන් එක් භාවනා ක්‍රමයක් සැකෙවින් හඳුන්වන්න.
    III. ශිෂ්‍ය ජීවිතයේ සාර්ථකත්වය සඳහා භාවනාව උපයෝගී කරගත හැකි ආකාරය පහදන්න.

03. I. " උට්ඨානවතෝ සතිමතෝ " යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.
    II. එම ගාථාවේ තේරුම ලියන්න.
    III. පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය උදෙසා ධම්මපදයෙන් ලැබෙන ආදර්ශ අගයන්න.

04. I. නැගෙනහිර දිසාව සහ උඩ දිසාව නියෝජනය වන සමාජ කණ්ඩායම් දෙක නම් කරන්න.
    II. දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් වලින් තුනක් ලියන්න.
    III. "සමාජ කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධය සමාජයක යහපැවැත්මේ පදනමයි, අගයන්න.

05. I. ස්තූප ආකාර අතරින් දෙකක් නම් කරන්න.
    II. ස්තූපයක් ඇඳ එහි කොටස් නම් කරන්න.
    III. ශ්‍රී ලාංකීය කලා ශිල්පීන්ගේ කලාකුසලතාවය ආරක්ෂා කරගැනීම ජාතික අවශ්‍යතාවයකි. පහදන්න.

06. I. සතර අගති නම් කරන්න.
    II. ඉහත I හි සඳහන් එකක් සැකෙවින් හඳුන්වන්න.
    III. ධාර්මික රාජ්‍ය පාලනයක් පවත්වා ගෙන යෑමට මෙම සංකල්පයයන් උපායෝගි කරගන්නා ආකාරය විස්තර කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.
    I. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි.
    II. අලුවිහාර ධර්ම සංගායානව.
    III. මුරගල.
    IV. සද්ධාව.



(4) www.PastPapers.WiKi (4)
Download Term Test Papers, Short Notes From One Place!

# LOL.lk
## BookStore



# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**